
"අපි" - ...
මගේ පන්තියේ හිටිය ළිලා, රසිනි
මට මතක...
දවල් ඉන්ටවල් එකේදී
සැකේ අත නැතිව ඉන්නා විට
දසේ උඩට බිංදු මගේ වඩයෝ
කෑල්ලක්....
එහෙම කෑ මට නම්
උන්ට එපෙනිව යන්ට
කොහොමවත් බෑ මටනං
උඹලාට දුන්න මගේ
බඩගින්න... නොකියාම
එදා

සිහිපත්වෙයි
හැමවිටම හැමතැනම
පෙර මෙන් අදද
අද මෙන් හෙටද
සුරතක වළලු හඬන විට
කෙහෙරොදක් සුළඟට වැනෙන විට
ඔසරියක් නැලැවී නැලැවී ඇදෙන විට
උද්‍යාන බංකුවක් මත
පර මල් ඉහෙන විට .

කොතරම් සිල්ලරද
මතකය

**වර්ණා රසිකා ගුණවර්ධන**

## ලෝක කාන්තා දිනය

**ජයසේන කොඩිතුවක්කු**



සෙනෙහස දයා කරුණා ගුණ පිරුනු හද
කැපවුන සැමට උපදින්නට ලොව නිබඳ
ඉපදුන සැමගෙ දිවි ම[illegible] සරු කරන්නද
කතුන ගෙ මෙහෙය මිස වෙන මොන පිහිටක්ද

නංගී අක්ක අම්මා සහ ආතම්මා
දුවනිය ලේලි මිණිබිරි ලොකු පොඩි අම්මා
බිරිඳක් වුනේ වරෙකදි මේ අයම තමා
රැකගතයුතු ගරු කළයුතු නොවෙද සැමා

ආචාරය අපේ කතුනට ගුණ ගරුක
හිමිවිය යුතුය නොඅඩුව එය නිසිලෙසක
සුරැකිය යුතුය නිදහස ඇගෙ හැම විටෙක
සැළකිය යුතුය මේ ගැන අද වැනි දිනෙක

## රෑ කුමාරි මල් පිපිලා

**නාලනී ද සිල්වා**



රෑ කුමාරී හිනැහිලා මා දෙතොල මදහස ගල්වලා
මා නෙතට පිනි තවරලා හද කොනක සත්සර මත් කලා
පායනා සඳපාන අද්දර හිමවතක ඔබ තනිවෙලා
ආදරේ හද පතුලෙ කිමිදී මටම නුඹ තව අමතලා

හිරු නැගෙන්නට පලමු හසරැල් වියැලිලා යන්නට එපා
මගෙ කුමාරී දිවි තුරා රන් රුවට ලංවෙමි එය සැපා
සඳ රැසින් නුඹ සැඟවෙලා හද වලාකුලකින් දෙයි උපා
හොර ඇසින් බැලූවොත් හදේ සරතැස නිවයි නුඹ සැක නොපා

සඳ තනිවෙලා සඳ අසල හිඳ වලාකුලටත් ගී කියා
සුදු මිහිදුමක් රැඳි රැයක මගෙ හිත අමතලා නුඹ ගියා
මල් කුමාරී රෑ අහස් ගැබ සේලයෙන් සරසා වියා
මුදු හාදු සතපවා යන්නට යලිත් නුඹ එනවද දයා






## තාත්තා බලන්න ගියෙමි

**රවී සිරිවර්ධන.**

කඩ මණ්ඩියෙන් වමට හැරුනාම
වැඩිය කවුරුත් නොයන අඩිපාර
අලුත් තණකොළ පඳුරු ගඳපාන
කරදණ්ඩ උස්සලා බලනවා

ඇවිද යම් නොරිදවා ඒවාට
රබර් මණ්ඩියේ ආලින්දයට
තාත්තා නතර කර ආ තැනට...

ඉස්සිලා තියන රතු පස් ගොඩට
හතර ගාතෙන් වැටුණ මල් වඩම
කම්බි මතු වී විකල් වූ මුහුණ
එදාටත් වඩා ශෝකය ගලනවා.

තාත්තගෙ හිතේ තිබු තෙතමනය
උරාගෙන එදා සරුවට වැඩුන
රබර් මණ්ඩිය එකත් පස හිඳින

කිරි එරුන හරි තරුණ ගස් වලට
කිරි පිහිය යවා බඳ වට පෙමින
කිරි දෙවූ හැටි දනී මණ්ඩියම

මාසයක් ගෙවුණ තැන
තාත්තා මෙහි නතර කොට පැමිණ
රබර් ගෙඩි පැලී පොළොවේ හැපෙන
විලාපය ඇසේ මණ්ඩිය තුළිනවා..

කොම්පැනිය ඇවිත් මල්ලිගෙ ගෙදර
රැගෙන ගොස් රබර් මණ්ඩියෙ යතුර...

## සැකය

**ආනන්ද ගුණතිලක**



හොපර්ස් ක්‍රොසිං

බියකරු දෙයකි හැම සතුටම ගිල ගන්න
හදවත් බිඳ දමයි - බැහැ එය වල කන්න
සයනයිටි වලට වැඩි බල සම් පන්න
වලාහල විසකි මිතුදම් සිඳ ලන්න

හද පතුලටම විස උල් කටු ඇණිය හැකි
මුලු ගත දවාලා සියොලඟ කැසිය හැකි
සිත ගත තලා නි දි සුව නැති කෙරුව හැකි
දවසේ සියලු වැඩ අතපසු කෙරුව හැකි

හිතවත් කම් තලා පොඩිකර දමන විට
කෑලි කැඩී විසිරී යයි හතර වට
අඹු සැමි සතුට ඉගිලෙයි පර සක්ව ලට
හදවත් පාරවයි විඳගනු බැරි ලෙ සට

බය ඉපදවිය හැකි මනසක් මීට වඩා
මේ තුන් ලොවම නැත, එය කිය හැකිය හඬා
මුහු ණට මුහු ණ ලා සෙනෙහෙන් වචන දෙඩා
වනසා දමයි පවු ලක ආදරය කඩා

මෙය කැත පුරුද්දකි, සැනසුම නැති කරන
වස කුප් පියකි, හිතවත්කම් බිඳ දමන
කුඩු පට්ටම් කරයි, මිතුදම් සැන යකින
බෙහෙතක් නැත තවම, එය සුවපත් කරන

ඔබගේ ලඟත් ඇත මාගේ ලඟත් ඇත
මොකට මැව්වාද දෙවියන් මේ විපත
පෙන්වා හෝ නොපෙන්වා තද කරන් හිත
එය නැති කෙණෙක් කොතැනද මතුපි ට දියත

ඇතිමු ත් බැරි නමුදු නැතිවත් කුමන පල
ඕනෑ නැති උනත් අහකට නොයන කල
මනසට කයට ලෙඩ දෙන 'නියගලා මල'
සැකයයි හි තේ, ඔබ හා මා දුරස් කල